

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT

2023

ලෝහෝර් ආර්යා ණය අරමුදල - මුදල් අමාත්‍යාංශය
லோஹோர் சீமாட்டிக் கடன் நிதியம் - நிதி அமைச்சு
Lady Lochore Loan Fund - Ministry of Finance

පටුන

සංස්ථාපිත තොරතුරු **01**

සභාපතිතුමියගේ පණිවුඩය **02**

පාලන භාරකාරතුමියගේ පණිවුඩය **03**

1. අරමුදලේ පසුබිම **04**

1.1 භාරකාර මණ්ඩලය **04**

- 2023 වසරේ අරමුදලේ කාර්යය මණ්ඩලය **05**

1.2 සංවිධාන ව්‍යුහය **05**

2. **2023 වසරේ අරමුදලෙහි කාර්යසාධනය**

2.1 2023 වසරේ ප්‍රතිලාභීන් **06-08**
2.2 ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා ප්‍රගතිය **09-10**
2.3 නිකුත් කල ණය සීමාවන් හා ණය මුදල් වටිනාකම **10**
2.4 ණය අයකර ගැනීමේ ප්‍රගතිය **10-11**
2.5 කාර්යාල සංකීර්ණය - ලෝහෝර් ආර්යා ණය අරමුදල **11**
2.5.1 කුලී ආදායම **11**
2.5.2 අරමුදලෙහි තිරසාරභාවය **12**
2.5.3 මෙහෙයුම් ආදායම **12**

3. සාමාන්‍ය පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය

3.1 සේවක අභිප්‍රේරණය ඉහළ නැංවීම **(කාර්ය මණ්ඩල පුහුණුව - 2023)** **13**

3.2 අරමුදලේ බඳවා ගැනීමේ සහ උසස්වීම් පරිපාටින් **13**

1. නව බඳවා ගැනීම් **13-14**
3.3 අරමුදල් පරිශ්‍රය නවීකරණය කිරීම **14**
3.4 කාර්ය මණ්ඩල පරිපාලන හා කාර්යාලීය ක්‍රමවේදයන් විධිමත් කිරීම/අරමුදලේ සංවත්සර සැමරුම **15-16**
3.5 කාර්ය මණ්ඩල ණය **17**
3.6 ඉඩම් ඔප්පු සහ බැදුම්කර **17-18**
3.7 රැස්වීම් **18**
3.8 විගණන හා කළමණාකරණ කමිටුව **18**

4. අනාගත සැලසුම් **19**
5. අරමුණු සපුරාලීමට පවතින බාධාවන් **20**
6. ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව **21**
7. ආදායම් ප්‍රකාශනය **22**
8. මූල්‍ය තත්ව ප්‍රකාශනය **23**
9. ප්‍රාග්ධන වෙනස්වීමේ ප්‍රකාශය **24**
10. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය **25**
11. ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති
    1. පොදු **26**
    2. වත්කම් සහ එහි වටිනාකම් තක්සේරු කිරීමේ පදනම **26-27**
    3. වගකීම් සහ ප්‍රතිපාදන **27**
    4. ආදායම් ප්‍රකාශනය **28**
12. මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන් **29-33**

ලෝහෝර් ආර්යා ණය අරමුදල

දැක්ම

රාජ්‍ය හා රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවකයින් සහ
ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සඳහා මූල්‍ය පහසුකම්
සලසා දෙනු ලබන ප්‍රමුඛ ආයතනයක් ලෙස ක්‍රියා කිරීම.

මෙහෙවර

රාජ්‍ය හා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවකයින් සහ
ත්‍රිවිධ හමුදා සාමාජිකයින් ණය බරින් මුදවා යහපත් මානසික
පරිසරයකින් යුත්
රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීම සඳහා දායකවීම.

අරමුණ

රාජ්‍ය හා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවකයින් හා
ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සඳහා සහනශීලී පොලී අනුපාතයක් හා පහසු
කොන්දේසි මත
කෙටි කාලීන ණය මුදල්, ප්‍රමාදයකින් තොරව ලබා දීම මඟින්
ඔවුන්ව ණය බරින් මුදවා ගැනීම.

කාර්ය භාරය

- ණය අරමුදල තිරසාරව පවත්වා ගනිමින් සේවා ලාභීන් සඳහා ණය පහසුකම් සැපයීම.
- ආයතනික ප්‍රවර්ධනය සහ එයට සාපේක්ෂව ධාරිතාවය වැඩි කිරීම.
- අරමුදල් සම්පාදනය කර ගනිමින් ආයතනය පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියා පටිපාටින් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- ණය කළමනාකරණය සඳහා යෝග්‍ය වන ක්‍රමෝපායන් දියුණු කිරීම සහ ණය දීමේ පහසුකම් කාර්යක්ෂමව කිරීම සහ වැඩි දියුණු කිරීම.
- අනිකුත් රාජ්‍ය ආයතන වල සේවකයින් සඳහා වූ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ දී පහසු කාරකයෙකු වශයෙන් කටයුතු කිරීම.
- ණය ලබා දීමේදී හා කටයුතු පවත්වාගෙන යාමේදී විධිමත් මූල්‍ය පාලන ක්‍රමවේදයක් ඇතිව කටයුතු කිරීම.

සංස්ථාපිත තොරතුරු

ආයතනයේ නම ලිපිනය :

- ලෝහෝර් ආර්යා ණය අරමුදල
- 100 3/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

සංස්ථාපිත කිරීම :

- 1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදල භාරකාර මණ්ඩල පනත (1953 සංශෝධිත) යටතේ ස්ථාපිත මුදල් අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක ව්‍යවස්ථාපිත ආයතනයකි.

භාරකාර මණ්ඩලය :

➢ ජේ.කේ.එන්.සමන්මලී මහත්මිය	-	සභාපති, (අධ්‍යක්ෂක - ආයෝජන හා ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව)
➢ කමලා රණතුංග මෙනවිය	-	පාලන භාරකාර, ලෝහෝර් ආර්යා ණය අරමුදල
➢ තුෂාර සෙනෙවිරත්න මහතා	-	භාරකාර
➢ එම්.සී.සුබසිංහ මහත්මිය	-	භාරකාර
➢ සරිත් පතිරත්න මහීපුත්‍ර මහතා	-	භාරකාර
➢ ජී.ඒ.ඩී.පී. විජේරත්න මහත්මිය	-	භාරකාර (2023.08.28 දින සිට)
➢ අනුරාධා ගල්ලන්ගොඩ මහත්මිය	-	භාරකාර (2023.08.28 දින සිට)

විගණන කමිටුව :

➢ කේ.එම්.බී.පී.වීරසිංහ මැතිණිය	- සභාපති, (ප්‍රධාන ගණකාධිකාරී, මුදල් අමාත්‍යාංශය)
➢ තුෂාර සෙනෙවිරත්න මහතා	- සාමාජික (භාරකාර, ලෝහෝර් ආර්යා ණය අරමුදල)
➢ සරිත් පතිරත්න මහීපුත්‍ර මහතා	- සාමාජික (භාරකාර, ලෝහෝර් ආර්යා ණය අරමුදල)

විගණක :

HMW ඇසෝසියේට්ස්,
වරලත් ගණකාධිකාරී,
28, යූ.ඊ.පෙරේරා මාවත,
රාජගිරිය.

නිල බැංකුකරු :

මහජන බැංකුව,
මූලස්ථාන ශාඛාව,
කොළඹ

සභාපතිතුමියගේ පණිවුඩය

1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදල් පනත යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් වන ලෝහෝර් ආර්යා ණය අරමුදල ණය බරින් පීඩිත වූ රාජ්‍ය සේවකයන් ඉන් මුදවාගෙන සහන සැලසීමේ මූලික අරමුණින්, ස්කොට්ලන්ත ජාතික ජීන් ලෝහෝර් ආර්යාව විසින් තම පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් 1927 මාර්තු මස 26 දින පිහිටුවන ලදී. වසර 96 ක් පුරාවට ණය බරින් පීඩිත වූ විවිධ ස්ථරවල රාජ්‍ය නිළධාරීන් හට ඔවුන්ගේ මූල්‍ය අවශ්‍යතා සැපිරීම තුලින් සහන සැලසීමට මහඟු කර්තව්‍යයක් ලෝහෝර් ආර්යා ණය අරමුදල සිදු කර ඇත.


ඒ අනුව යමින් 2023 වර්ෂයේදී ද රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු සේවකයින් 3496 ක් මෙම අරමුදලේ ප්‍රතිලාභීන් වී ඇති අතර ඔවුන් සඳහා ණය පහසුකම් වශයෙන් ලබාදුන් මුදල රුපියල් මිලියන 447.68 කි. මෙම සංඛ්‍යාව 2022 වර්ෂයේ ණය ලබාදුන් සංඛ්‍යාවට සාපේක්ෂව 29.24% ක වැඩි වීමකි.

පසුගිය වර්ෂ ගණනාවක් මුළුල්ලේ වර්ෂයෙන් වර්ෂය ප්‍රගතිය කරා ගමන් කරන ලද අරමුදලේ මූල්‍ය කාර්ය සාධනය 2023 වර්ෂයේදී ද සාර්ථකව ඉදිරියට ගෙනයාමට අරමුදල සමත්ව ඇත. පෙර වර්ෂයට සාපේක්ෂව අරමුදලේ මුළු ආදායම 28% කින් එනම් රුපියල් මිලියන 31.5 කින් වැඩි වී ඇති අතර, ආර්ථිකයේ ඇති වූ ඉහල උද්ධමන බලපෑම තුල වුවද අරමුදලේ මෙහෙයුම් වියදමෙහි ඉහල යෑම 16% ක් වැනි අවම මට්ටමක පවත්වා ගැනීමට අරමුදල සමත් විය. ආයතනයෙහි බදු පෙර ශුද්ධ ලාභය රුපියල් මිලියන 23.2 කින් වැඩි කර ගැනීමට හැකියාව ලැබූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව 38% ක වැඩි වීමකි. එමෙන්ම බදු වශයෙන් රුපියල් මිලියන 26.3 කින් අරමුදල විසින් රාජ්‍ය ආදායම් උත්පාදනයට දායක වී ඇති අතර, එය පෙර වර්ෂයේ ගෙවූ බදු ප්‍රමාණය හා සැසඳීමේදී 66% ක වැඩි වීමකි.

අරමුදල සතු ජංගම ගිණුම් වල පැවති අතිරික්ත මුදල් ප්‍රමාණය වඩා ඵලදායී අයුරින් ආයෝජනය කිරීම සඳහා අරම්භ කරන ලද " Money Market Savings Account" ගිණුම හරහා රුපියල් මිලියන 1.7 ක ශුද්ධ පොලී ආදායමක් උපයා ගැනීමට අරමුදල සමත් විය.

තවද අරමුදලේ කාර්යක්ෂම කාර්ය සාධනය සඳහා අත්‍යවශ්‍ය සාධකයක්ව පැවති මානව සම්පත් හිඟය කළමණාකරනය සඳහා කළමනාකරන සහකාර 111 ශ්‍රේණියේ තනතුරු 11 ක් හා රියදුරු තනතුරු 1 ක් විධිමත් බඳවා ගැනීමේ පටිපාටියට අනුව බඳවාගෙන අරමුදලේ මෙහෙයුම් කටයුතු 2023 වර්ෂය තුලදී තවදුරටත් ශක්තිමත් කිරීමට හැකියාව ලැබිණි. මූල්‍ය ආයතනයක වැදගත්ම ක්‍රියාවලිය වන ණය කළමණාකරන කාර්යය වඩා ඵලදායී අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යවශ්‍ය වූ ණය අධික්ෂණයෙහි වගකීම පැවරීම සඳහා මාණ්ඩලික නිළධාරි තනතුරක් ධුරාවලියට ඇතුලත් කර අනුමත කරවා ගැනීමට අරමුදල සමත් විය.

ආයතනයක ඵලදායී හා කාර්යක්ෂම කාර්යසාධනයෙහිලා ප්‍රමුඛතම සාධකයක් වන ප්‍රතිපත්තිමය හා මෙහෙයුම් තීරණ ගනු ලබන පාලක මණ්ඩලයෙත් එම තීරණ ක්‍රියාත්මක කරනු ලබන කාර්ය මණ්ඩලයෙත් අතිමහත් කැපවීම නොවන්නට මෙම අරමුදලේ වර්තමාන ප්‍රගතිය ලභා කර ගැනීමට කිසිසේත්ම හැකියාවක් නොලැබෙනු ඇත. ඒ සියළු දෙනා වෙනුවෙන් මාගේ ප්‍රණාමය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. එමෙන්ම අරමුදලේ සාර්ථකත්වය ළඟා කර දීමට සෑම අවස්ථාවකදීම සහය දුන් මුදල් අමාත්‍යාංශයටද මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.



ජේ.කේ.එන්.සමන්මලි
සභාපති
ලෝහෝර් ආර්යා ණය අරමුදල

පාලන භාරකාරතුමියගේ පණිවුඩය

අරමුදලේ නිර්මාතෘතුමිය වන ජීන් ලෝහෝර් ආර්යාවගේ අරමුදල ස්ථාපිත කිරීමේ අරමුණු තවදුරටත් උපරිම ආකාරයෙන් සාක්ෂාත් කරගැනීමට ආයතනය පිහිටුවා වසර 96 ක් සපිරෙන 2023 වර්ෂයේ දී හැකි වී ඇති බව මා සනිටුහන් කරනු ලබන්නේ හදපිරි සතුටිනි.අපේක්ෂිත මට්ටමින් අරමුදලේ මෙහෙයුම් කටයුතු දියත් කිරීමට හැකිවීම මත රාජ්‍ය සේවා ණය අයදුම්කරුවන් 3496 දෙනෙකු වෙත රු.මිලියන 447.6 ක් ණය වශයෙන් ප්‍රදානය කිරීමට හැකි වී ඇත.2022 වර්ෂයට සාපේක්ෂව ණය නිකුත් කල රාජ්‍ය සේවකයන්ගේ ප්‍රමාණය 29% කින් වර්ධනය කරගැනීමට හැකි වී ඇති අතර එමඟින් එම පිරිස් සඳහා සිය හදිසි මූල්‍ය අවශ්‍යතාවයන් වෙනුවෙන් යම් පිළිසරණක් සැපයීමට හැකි වී තිබීම මත ලෝහෝර් ආර්යාවගේ එකී ආරම්භක අරමුණු මෙම වසරේ දී ද උපරිම වශයෙන් ලඟාකර ගැනීමට හැකි වී ඇත.මෙයට සමගාමීව ණය අයකර ගැනීම් ලෙස රු.මිලියන 409.2 ක් අයකර ගැනීමෙන් අනතුරුව රු.මිලියන 145 ක මුළු ආදායමක් උපයමින් ද ඒ සඳහා රු.මිලියන 61.3 ක පොදු කාර්යය පිරිවැයක් දරා රු.මිලියන 83.6 ක බදු පෙර ශුද්ධ ලාභයක් උපයා රු.මිලියන 26.2 ක බදු ආදායමක් රජයට සපයා දී රු.මිලියන 57.3 ක බදු පසු ශුද්ධ ලාභයක් ඉපයීමට හැකි වී තිබීම ඉමහත් සතුටට කරුණකි.

2023 වසරේ දී අපේක්ෂිත මෙහෙයුම් කටයුතු මෙලෙස ඉහත ආකාරයෙන් උපරිම මට්ටමකට ළඟා වීමට හැකි වී තිබීම හේතුවෙන් එම තත්වය 2024 සඳහා වඩාත් ශුභදායි ආකාරයෙන් මෙහි ප්‍රගතිය සඳහා බලපානු ලබන බවට මා තරයේ විශ්වාස කරමි.

තවද 1995 වර්ෂයේ දී මෙම අරමුදලේ අභිවෘද්ධිය වෙනුවෙන් එවකට රු.මිලියන 15 ක පොලී රහිත ණය මුදලක් මුදල් අමාත්‍යාංශය විසින් ලබා දී ඇති අතර එය ගිවිසගත් ආකාරයට ආපසු ගෙවා අවසන් කර ඇති අතර වර්තමානයේ දී ඒ ආකාරයෙන් පොලී රහිත ණය මුදලක් මෙම ආයතනය වෙත ලබාදෙන්නේ නම් අරමුදලේ කටයුතු වඩාත් පුළුල්ව ශාඛා ජාලයක් සහිතව තවදුරටත් ව්‍යාප්ත කිරීමට වත්මන් පාලක මණ්ඩලයට හැකියාව පවතින බව මෙහිලා විශේෂයෙන් සඳහන් කරමි.එසේම භාරකාර මණ්ඩලයේ තීරණය පරිදි විදේශීය ධූත මණ්ඩල හරහා මෙම අරමුදල වෙත මූල්‍ය පරිත්‍යාග ලබාගැනීම වෙනුවෙන් ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා වෙත ලිඛිත ඉල්ලීමක් මේ වනවිටත් සිදුකර ඇති අතර එම ඉල්ලීමට අනුව ලැබෙන ප්‍රතිචාර මත අරමුදලේ මෙහෙයුම් කටයුතු තවදුරටත් ඉදිරියේ දී ව්‍යාප්ත කිරීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කරමි.

අපේක්ෂිත මට්ටමින් මෙහෙයුම් කටයුතු සිදුකර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ අප්‍රමාදව ලබාදෙමින් නිරන්තයෙන් අත්වැලක් සැපයූ මෙහි භාරකාර මණ්ඩලයත් සියළු උපදෙස් හා මඟපෙන්වීම් සිදුකරන මුදල් අමාත්‍යාංශයේ නිලධාරි මඩුල්ලත් උපරිම කැපවීමකින් මෙහෙයුම් කටයුතු සිදුකරන අරමුදලේ කාර්යය මණ්ඩලයත් මෙකී සාර්ථකත්වයේ නියමුවන් සේ හැඳින්විය හැක.

අනාගතයේ දී මෙහි සේවාවන් තව තවත් ව්‍යාප්ත කරමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කරන අතර අරමුදලේ නිර්මාතෘතුමියගේ පරමාර්ථවලට අනුගතව තවදුරටත් එම කාර්යයන් පුළුල් කිරීමට ආයතනයේ භාරකාර මණ්ඩලයට හා කාර්යය මණ්ඩලයට ශක්තිය ධෛර්ය හා වාසනාව ලැබේවා යි ප්‍රාර්ථනා කරමි.

කමලා රණතුංග
පාලන භාරකාර
ලෝහෝර් ආර්යා ණය අරමුදල

01

අරමුදලේ පසුබිම

ශ්‍රී ලංකාවේ කලක් වාසය කල ස්කොට්ලන්ත ජාතික ජීන් ලෝහෝර් ආර්යාව විසින් ණය අරමුදලක් පිහිටුවීමට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය සඳහා පවුම් 300 ක මුදලක් පරිත්‍යාග කර තිබිණි. එවකට පුණ්‍ය කොමසාරිස්ව සිටි සී.ඊ.වී.නැතනියල්ස් පියතුමා අරමුදල පිහිටුවීමේ කාර්යයෙහි මූලිකව කටයුතු කර ඇති අතර එය 1927 මාර්තු 26 වන දින ලෝහෝර් ආර්යා ණය අරමුදල නමින් ආරම්භ කරන ලදී. එමෙන්ම අරමුදල 1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදල් පනත මගින් ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත් විය.

එදා සිට මෙම අරමුදල ප්‍රතිලාභීන් වෙත ණය ප්‍රදානය කරමින් සහ එම ණය ආපසු අයකර ගනිමින් ක්‍රීය අරමුදලක් ලෙසින් ක්‍රියාත්මක වෙමින් පවතී. රාජ්‍ය අංශයේ මෙන්ම වෙළඳ සමාගම්වල සේවය කරන සේවකයින්ටද තමන්ගේ කෙටි කාලීන මුදල් අවශ්‍යතා සපුරා ගැනීමට එවකට පැවති බැංකු ක්‍රමයෙන් පිටිවහලක් නොලැබුන හෙයින් ඔවුන් අධික පොළියට ණය සපයන පුද්ගලයන්ගෙන් ණය ලබා ගැනීමට පුරුදු වී සිටියහ. මේ පසුබිම තුල රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ සේවකයින්ද ණය බරින් පීඩනයට පත්විය. මෙවැනි පරිසරයක් තුල ලෝහෝර් ආර්යා ණය අරමුදල පිහිටුවීමෙන් පසු මෙම සේවකයින්ට ණය ලබා ගැනීමේදි ඉමහත් සහනයක් සැලසුනි. 1951 මෙම පනත ව්‍යවස්ථාගත වීමත් සමගම අරමුදලට රජයෙන් මෙන්ම වෙනත් පරිත්‍යාගශීලීන්ගෙන් ද ලැබුන ආධාර උපයෝගි කරගෙන මෙම ආයතනයටම අයත් තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර ඇත.



ජීන් ලෝහෝර් ආර්යාව




1.1. භාරකාර මණ්ඩලය

භාරකාර මණ්ඩලය ගරු මුදල් ඇමතිතුමා විසින් පත් කරනු ලබන රාජ්‍ය අංශයේ සහ සුදුසුකම්ලත් පෞද්ගලික අංශයේ නියෝජිතයන්ගෙන් සමන්විත වේ. මෙම ආයතනයෙහි අනුශාසක ධුරය මුදල් අමාත්‍යතුමා විසින් හොබවනු ලබයි. අරමුදලෙහි පරිපාලන කටයුතු සඳහා පාලන භාරකරුවකු ලෝහෝර් ආර්යා ණය අරමුදල් පනතේ 10 වන හා 11 වන වගන්ති ප්‍රකාරව භාරකාර මණ්ඩලය සඳහා පත්වූ අය අතරින් කෙනෙකු පත්කරනු ලැබේ. එම පනතෙහි 5 වන වගන්තියට අනුව භාරකාර මණ්ඩලයෙහි සභාපති තනතුර භාණ්ඩාගාර නියෝජිතවරයා වෙත පවරා ඇත.

වගුව 01 – 2023 වසරේ අරමුදලේ කාර්යය මණ්ඩලය

අනුමත තනතුර	අනුමත තනතුරු සංඛ්‍යාව	සේවයේ නියුතු සංඛ්‍යාව
ගණකාධිකාරි	01	01
පරිපාලන නිලධාරි	01	01
ගිණුම් නිලධාරි	01	01
අභ්‍යන්තර විගණක නිලධාරි	01	01
ණය අයකර ගැනීමේ නිලධාරි	01	01
තොරතුරු තාක්ෂණ නිලධාරි	01	-
ණය අධික්ෂණ නිළධාරි	01	-
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන ශ්‍රේණිය)(ලේඛනාගාර සහකාර ඇතුළු)	34	28
ගොඩනැගිලි අධීක්ෂක (කළමනාකරණ සහකාර - තාක්ෂණික ශ්‍රේණිය)	01	-
කාර්යාල සහායක (ප්‍රාථමික ශිල්පීය නොවන) (නිල බංගලා භාරකරු ඇතුළුව)	07	06
ගොඩනැගිලි නඩත්තු සහායක (ප්‍රාථමික අර්ධ ශිල්පීය)	01	01
රියදුරු (ප්‍රාථමික ශිල්පීය)	02	02
එකතුව	**52**	**42**

1.2 ලෝහෝර් ආර්යා ණය අරමුදලේ වර්තමානයේ පවතින අනුමත සංවිධාන ව්‍යුහය.



02

2023 වසරේ අරමුදලෙහි කාර්ය සාධනය


2.1 2023 වසරේ ප්‍රතිලාභීන්

2023 වසරේදී රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු සේවකයින් 3496 ක් මෙම අරමුදලේ ප්‍රතිලාභීන් වී ඇත. එම ප්‍රතිලාභීන් පදිංචි දිස්ත්‍රික්කය අනුව දෙවන වගුවෙහි වර්ගීකරණය කර ඇති අතර එය 2022 ට සාපේක්ෂව 29.24% ක ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. ප්‍රතිලාභීන්ගෙන් 75% කට අධික පිරිසක් ආරක්ෂක අංශයේ නියුතු පුද්ගලයින් වන බව පහත වගුවෙන් නිරූපනය වේ.

වගුව 02 – 2022/2023 වර්ෂවල ණයලබා ගත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවක ප්‍රතිලාභීන් දිස්ත්‍රික්ක අනුව

ප්‍රතිලාභීන් සංඛ්‍යාව				
දිස්ත්‍රික්කය	**2023**	**(%)**	**2022**	**(%)**
කොළඹ	581	16.62	582	21.52
ගම්පහ	563	16.10	492	18.19
අනුරාධපුරය	181	5.18	104	3.84
මහනුවර	232	6.64	134	4.95
වව්නියාව	8	0.23	1	0.04
කළුතර	315	9.01	302	11.16
රත්නපුර	129	3.69	100	3.70
ගාල්ල	194	5.55	116	4.29
කුරුණෑගල	352	10.07	230	8.50
පුත්තලම	30	0.86	28	1.04
යාපනය	0	0	1	0.04
පොළොන්නරුව	70	2.00	45	1.66
ත්‍රිකුණාමලය	12	0.34	13	0.48
මුලතිව්	1	0.03	0	-
බදුල්ල	157	4.49	74	2.74
මාතලේ	66	1.89	49	1.81
හම්බන්තොට	84	2.40	74	2.74
කෑගල්ල	206	5.89	146	5.40
මඩකලපුව	3	0.08	1	0.04
අම්පාර	53	1.52	33	1.22
මොණරාගල	85	2.43	64	2.37
නුවරඑළිය	52	1.49	47	1.74
මන්නාරම	0	0	0	-
මාතර	122	3.49	69	2.55
එකතුව	**3496**	**100**	**2705**	**100**

ප්‍රස්තාරය 01 - 2022/2023 වර්ෂවල ණය ලබා ගත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවක ප්‍රතිලාභීන් දිස්ත්‍රික්ක අනුව.



වගුව 3 - 2022 හා 2023 වර්ෂවල රාජ්‍ය සේවා ප්‍රතිලාභීන් තනතුරු අනුව.

තනතුර	2023	2022
කෝප්‍රල්	1036	590
හමුදා සෙබල	131	85
හමුදා සැරයන්	310	190
මේජර්	74	48
ලුතිනන්	21	16
බ්‍රිගේඩියර්	0	1
අරක්කැමි	11	8
භෝජනාගාර සේවක	17	12
පොලිස් කොස්තාපල්	313	294
පොලිස් සැරයන්	379	223
පොලිස් පරීක්ෂක	17	9
ප්‍රධාන පොලිස් පරීක්ෂක	24	22
උප පොලිස් පරීක්ෂක	58	50
පොලිස් ආරක්ෂක සහායක	1	1
පොලිස් සිවිල් සහායක	0	2
ගිනිගන්නා සහ පාර්සල් කරන්නා	3	18
රියදුරු	113	94
රිය සහායක	2	1
බන්ධනාගාර නියාමක	15	8
මැනුම් සහායක	8	5
සෞඛ්‍ය පරිපාලක	0	0
උපස්ථායක	3	1
සාමාන්‍ය කම්කරු	173	266
කාර්යාල සහායක	240	285
කළමනාකරණ සහකාර	217	147
සංවර්ධන සහකාර	69	41
ආයුර්වේද වෛද්‍ය සහායක	0	0
ඖෂධවේදී	0	2
මුරකරු	9	12
ආරක්ෂක නියාමක	3	3
මෝටර් කාර්මික	2	5
කාර්මික ශිල්පි	2	0
වඩු කාර්මික නිලධාරී	1	2
මානව සම්පත් සහකාර	0	0
පරිපාලන නිලධාරී	3	6
පෙදරේරු	1	1
ගණකාධිකාරී	9	13
ගබඩා සහායක	1	1
විදුලි කාර්මික	2	2

තනතුර	2023	2022
ඔවර්සියර්	1	7
සහකාර අධ්‍යක්ෂක	5	17
සහකාර ලේඛම්	2	1
පුනුරුත්ථාපන නිලධාරී	0	0
සිතාසිකරු	0	0
වනජීවී ආරක්ෂක නිලධාරී	5	2
කාලගුණ විද්‍යා නිලධාරී	2	0
පිළිගැනීමේ නිලධාරී	0	0
පොත් බැඳුම්කරු	1	1
කොමසාරිස්	2	0
වැඩසටහන් සහකාර	4	2
කොමිෂන් නොලත් නිලධාරී	54	47
ගිණුම් නිලධාරී	2	0
ක්ෂේත්‍ර සහායක	2	1
රසායනාගාර සහායක	1	1
කර්මාන්ත පරිපාලක	0	1
හෙද නිලධාරී	12	9
කපිතාන්	14	14
අස්ගොව්	4	4
අත් උදව්කරු	0	0
අයවැය සහකාර	1	0
පින්තාරුකරු	0	3
තාක්ෂණ නිලධාරී	6	3
තැපැල් සහකාර	12	9
අධීක්ෂණ නිලධාරී	0	2
තැපැල් නිලධාරී	5	12
ගිනිහටයන්	19	0
කර්නල්	6	16
පෙර පාසල් ගුරු	0	1
තැපැල්කරු	4	0
ලිපිකරු	1	0
පුස්තකාල සහායක	1	8
වෛද්‍ය නිලධාරී	1	0
මැෂින් ක්‍රියාකරු	1	4
ලෝහ පෑස්සුම්කරු	1	3
පශු වෛද්‍ය නිලධාරී	0	1
සුසාන භූමි භාරකරු	0	3
පරිවර්තක	1	1
වෙනත්	58	68
එකතුව	**3496**	**2705**


2.2 2023 ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා ප්‍රගතිය

පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයෙකුට මෙම අරමුදලෙන් ණය අයදුම් කළ හැක.

- විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවාවේ නියුතු වසර 3 ක අවම ස්ථිර සේවා කාලයක් හිමි රාජ්‍ය සේවකයකු වීම.
- අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් වසර 5 ක අවම ස්ථිර සේවා කාලයක් සපුරා තිබීම.
- ලබා දෙනු ලබන ණය මුදල් සම්පූර්ණයෙන්ම අයකර ගැනීමට තරම් ප්‍රමාණවත් සේවා කාලයක් තිබීම.(විශ්‍රාම ගන්නා වයස් සීමාව අවුරුදු 59 ලෙස සලකයි)
- අයදුම්කරු සඳහා ඉහත සුදුසුකම් සහිත ඇපකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කිරීම.
- අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් ඇපකරුවන් දෙදෙනාගෙන් එක් අයකු අවම වශයෙන් වසර 03 ක ස්ථිර සේවා කාලයක් පවතින විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවාවේ නියුතු අයකු වීම.
- සියළුම ණය අයදුම්කරුවන්ගේ මාසික වේතනයෙන් 40% සීමාව තුල ණය වාරිකය අයකර ගැනීමේ හැකියාව තිබීම.

වගුව 04 - සුදුසුකම්ලාභීන්ගෙන් ඉදිරිපත් වූ අයදුම්පත්‍ර හා ණය නිකුත් කිරීම පිළිබඳව 2023 වසරේ ප්‍රගතිය පහත වගුවෙන් පැහැදිලි වේ.

මාසය	**ණය අයදුම් කළ සංඛ්‍යාව**	**නිකුත් කල ණය සංඛ්‍යාව**	**ණය වටිනාකම (රු. 000)**
ජනවාරි	492	157	25,720,000
පෙබරවාරි	588	228	38,350,000
මාර්තු	537	332	55,230,000
අප්‍රේල්	181	262	38,250,000
මැයි	235	288	38,105,000
ජූනි	199	356	39,125,000
ජූලි	267	481	46,800,000
අගෝස්තු	246	335	32,150,000
සැප්තැම්බර්	225	237	22,750,000
ඔක්තෝබර්	295	282	31,005,000
නොවැම්බර්	244	268	40,000,000
දෙසැම්බර්	275	270	40,195,000
එකතුව	**3784**	**3496**	**447,680,000.00**



ණය අයදුම් කළ සංඛ්‍යාව 3784 ක් වුවද නිකුත් කල ණය සංඛ්‍යාව 3496 ක් විය. මෙම වෙනසට ආසන්නම හේතූන් වන්නේ 2023 වසරේ අවසන් මාසයන් තුල ඇප අත්සන් කිරීමට නොපැමිණි අයදුම්පත් 2024 වසර තුල ලැබීම , 2023 අවසන් මාසයන් තුල දි ලද යුද හමුදාවේ ණය අයදුම් පත් සඳහා ණය නිකුතුවේ දී අවශ්‍ය සී.එල් බලපත්‍ර 2024 වසර තුල ලැබීමද දැක්විය හැක.

2.3 නිකුත් කල ණය සීමාවන් හා ණය මුදල් වටිනාකම

2023.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ණය පොළි ප්‍රතිශතය 15%ක් දක්වා වැඩි කරන ලදී.

වගුව 05 - ණය මුදල් සීමාවන් අනුව ප්‍රගතිය.

උපරිම ණය සීමාව	නිකුත් කල ණය සංඛ්‍යාව	ණය මුදල් වටිනාකම (රු. 000)
300,000	51	15,300,000
250,000	113	28,250,000
200,000	66	13,200,000
175,000	885	154,875,000
150,000	214	32,100,000
100,000	1829	182,900,000
75,000	171	12,825,000
50,000	159	7,950,000
40,000	5	200,000
30,000	2	60,000
20,000	1	20,000
එකතුව	**3496**	**447,680,000**

2.4 ණය අයකරගැනීමේ ප්‍රගතිය


2020 සිට 2023 දක්වා වසර වලට අදාලව ණය මුදල් නිකුත් කිරීම හා අයකර ගැනීමේ ප්‍රගතිය 06 වන වගුවෙන් හා 03 වන ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරේ.

- ණය මුදල් නිකුත් කිරීම - අඩු වීම - 7.53%
- ණය අයකර ගැනීමේ - වැඩි වීම - 53.23%

වගුව 06 – 2020 සිට 2023 වසර දක්වා ණය නිකුත් කිරීම සහ ණය අය කර ගැනීම

වර්ෂය	ණය සංඛ්‍යාව	ණය නිකුත් කිරීම (රු.මි.)	ණය අයකර ගැනීම (රු.මි.)
2020	1735	217,880	429,989
2021	901	136,725	341,582
2022	2705	484,140	267,060
2023	3496	447,680	409,221

ප්‍රස්තාරය -03 ණය නිකුත් කිරීම සහ අයකර ගැනීමේ ප්‍රගතිය



2.5 කාර්යාල සංකීර්ණය - ලෝහෝර් ආර්යා ණය අරමුදල

2.5.1 කුලී ආදායම

ලෝහෝර් ආර්යා ණය අරමුදල් ගොඩනැගිල්ලේ වර්ග අඩි 5,500 ක් අරමුදලේ කාර්යාලය සඳහා භාවිතා කරමින් අතිරික්ත ඉඩකඩ ප්‍රමාණය පහත සඳහන් ආයතන වලට කුලී පදනම මත ලබා දී 2023 වර්ෂය තුල කුලී ආදායම වශයෙන් රුපියල් මිලියන 19.81 උපයා ගන්නා ලදී.

වගුව 07 – 2022 වසරේ ගොඩනැගිලි කුලී ආදායම

අනු අංක	ආයතනය	කුලියට හිටින මහල	වර්ග අඩි ප්‍රමාණය	ආදායම (රු.)
01	ලෝහෝර් ආර්යා ණය අරමුදල	3 - මහල	5500	-
02	රථ ගාල	පතුල් මහල	5290	-
03	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	බිම් මහල	5500	7,800,000
04	සමූපකාර සේවක කොමිෂන් සභාව	1 - මහල	2415	2,885,878
05	ලංකා විදුලිබල මණ්ඩලය	1 ,2 මහල	4700	5,300,000
06	ලංකා විදුලිබල මණ්ඩලය තොරතුරු අංශය	2 - මහල	2750	3,609,235
07	කුලී පදනමට ලබා දීමට තිබේ	2 - මහල	840	-
08	MAA ඇසෝසියේට්ස්	අංක :100/20	380	215,500
			27,375	**19,810,613**

2.5.2 අරමුදලෙහි තිරසාරභාවය


අරමුදලේ මෙහෙයුම් සහ මූල්‍ය තිරසාරභාවය පවත්වා ගැනීම සම්බන්ධයෙන් භාරකාර මණ්ඩලයේ දැඩි අවධානය යොමුව ඇත. මෙම ආයතනය භාණ්ඩාගාරයේ හෝ ජාතික අයවැය ප්‍රතිපාදන මත යැපෙන ආයතනයක් නොවන අතර සියළුම පොදුකාර්යය හා ප්‍රාග්ධන වියදම් ද ණය නිකුත් කිරීමේ ප්‍රතිපාදනද මෙම අරමුදල මගින් උපයනු ලබන පොලී ආදායම් හා අනෙකුත් ආදායම් මගින් ආවරණය කර ගැනීමෙන් අනතුරුව අඛණ්ඩව වාර්ෂිකව ලාභදායිත්වයකින් යුක්තව පවත්වාගෙන යාමට හැකි වී ඇත.

ආයෝජන වර්ගය	බැංකුව	2023/12/31 (රු.)	2022/12/31 (රු.)
ස්ථාවර තැන්පතු	මහජන බැංකුව	-	400,849,332
ස්ථාවර තැන්පතු	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	97,497,665	24,446,002
එකතුව		**97,497,665**	**182,607,161**

2.5.3 මෙහෙයුම් ආදායම

2023 වසර තුලදී මුළු මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 145.1 ක් වූ අතර ශුද්ධ මෙහෙයුම් අතිරික්තය රුපියල් මිලියන 57.4ක් විය. 2022 වසර තුලදී මෙහෙයුම් ආදායම හා ශුද්ධ මෙහෙයුම් අතිරික්තය පිළිවෙලින් රුපියල් මිලියන 113.6 ක් හා රුපියල් මිලියන 44.7 ක් ලෙස දක්නට ඇත. 2023 වසරේදී 2022 වසරට සාපේක්ෂව 28% ක ලාභදායීත්වයේ වර්ධනයක් අත්කරගැනීමට අරමුදලට හැකිවී ඇත.

ප්‍රස්තාරය -04 - මෙහෙයුම් ආදායම සහ මෙහෙයුම් අතිරික්තය 2020 - 2023



03

සාමාන්‍ය පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය

3.1 කාර්ය මණ්ඩල පුහුණුව - 2023

2023 වසරේදී බඳවා ගන්නා ලද නවක කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ නිළධාරීන් (10) දස දෙනෙකු වෙත, කළමනාකරණ සහකාර වෘත්තිය හදුන්වා දීමේ පුහුණු වැඩසටහනක්, අරමුදල වෙත සම්පත් දායකයකු ගෙන්වාගෙන එම පුහුණුව නවකයන් වෙත ලබා දීමට ගන්නා ලද භාරකාර මණ්ඩල තීරණයට අනුව ධීවර අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන් කටයුතු කරන ප්‍රවීන දේශක අනුෂා ගෝකුල මහත්මිය විසින් අඩ දින වැඩමුළුවක් 2023.12.29 වන දින අරමුදලේ භාරකාර මණ්ඩල රැස්වීම් ශාලාවේදී පැවැත්විය.

මෙම අඩ දින පුහුණු සැසියේදී කාර්යාල සේවා කාර්ය භාරය හඳුන්වා දීම සිදු කරන ලදි. අරමුදලේ කළමනාකරණ සහකාර සේවයට බඳවාගෙන ඇති නවක නිළධාරීන් වෙත තම සේවා කාර්ය භාරය හඳුන්වා දීම (Induction Programme) අනුගමනය කළයුතු නිවැරදි කාර්යාල ක්‍රම පිළිවෙත් පිළිබඳ අවබෝධයක් ලබා දීම මෙමගින් සිදු කෙරිනි.

අරමුදල සතු වාහන නඩත්තුව සම්බන්ධයෙන් රාජකාරී ඉටුකරනු ලබන සියළුම නිළධාරීන් වෙත මුදල් අමාත්‍යාංශය වෙතින් පුහුණුවීමක් ලබා දීමට ගන්නා ලද භාරකාර මණ්ඩල තීරණයට අනුව මුදල් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වෙත ඉදිරිපත් කළ ඉල්ලීමට අනුව විදේශ කටයුතු අමාත්‍යාංශයේ යාන්ත්‍රික ඉංජිනේරු එන්.කේ. සුබසිංහ මහතා විසින් 2023.12.20 දින අරමුදල් පරිශ්‍රයේදී එම වැඩසටහන පවත්වන ලදි.

අරමුදලේ වාහන නඩත්තුව සම්බන්ධයෙන් සිදුකළ යුතු කාර්ය භාරය, ධාවන සටහන් පොත් නිසියාකාරව පවත්වාගෙන යාම සිදුකළ යුතු පරීක්ෂාවන් පිළිබඳව අවබෝධයත් ලබා දීම මෙම පුහුණුවේ අරමුණ විය. අරමුදලේ රියැදුරන්, ප්‍රවාහන නිළධාරී, ප්‍රධාන කළමනාකරණ සහකාර නිළධාරී සහ පරිපාලන නිළධාරි යන අය මීට සහභාගී වන ලදි.

3.2 අරමුදලේ බඳවා ගැනීමේ හා උසස්වීමේ පටිපාටින්

<u>උසස්වීම් සහ නව බඳවා ගැනීම්.</u>

3.2.1 වාර්ෂික කාර්ය සාධන ඇගයීම සිදුකර බඳවා ගැනීමේ පටිපාටියෙහි එන උසස්වීමේ පටිපාටියට අනුව එහි සඳහන් සුදුසුකම් සියල්ල සම්පූර්ණ කරන ලද කළමනාකරණ සහකාර III ශ්‍රේණියට අයත් එක් නිළධාරියෙක් කළමනාකරණ සහකාර II ශ්‍රේණියට උසස් කරන ලදි.

3.2.2 <u>නව බඳවා ගැනීම්</u>

- මැතිවරණ කොමසාරිස්තුමාගේ විශේෂ අනුමැතිය යටතේ සහ මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විශේෂ අවසරය ලබා අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලය තුළ කළමනාකරණ සහකාර සහ රියැදුරු තනතුරු සඳහා පැවතුනු විශාල ප්‍රමාණයක පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට අයදුම්පත් කැඳවා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් සහ අරමුදලේ නිල වෙබ් අඩවිය හරහා ප්‍රචාරය කරන ලදී. එමගින් කළමනාකරණ සහකාර 111 තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා ආකර්ෂණය කරගත් අයදුම් පත්‍ර 300 ක් අතරින් විනිවිද භාවයකින් යුක්තව සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්පත් 190 ක් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට කැඳවන ලදි.

- දින 6ක් පුරා පැවති සම්මුඛ පරීක්ෂණ මාලාවන්ට සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් 122 කු පෙනී සිටි අතර එම සම්මුඛ පරීක්ෂණ මාලාවේදී ඉහළ ලකුණු ලබා ගත් අයදුම්කරුවන් දසදෙනා වෙත 2023.05.10 දින සිට කළමනාකරණ සහකාර 111 තනතුරෙහි පත්වීම් ලබා දෙන ලදි.

- 2023 වසර තුළ වරින් වර සේවකයන් 06 දෙනෙකු දෙස් විදෙස් රැකියා අවස්ථාවන් සඳහා ඉල්ලා අස්වූයෙන් කළමනාකරණ සහකාර 111 තනතුර සඳහා ඇති වූ පුරප්පාඩු 12න් 11ක් සඳහා නවකයන් පත්කර ගන්නා ලදි.

- අරමුදල සතු වාහන ධාවනය සඳහා ස්ථාපිත කර තිබූ රියැදුරු තනතුරු 2න් එකක් පුරප්පාඩු වූයෙන් රියැදුරු තනතුරෙහි පුරප්පාඩුව පිරවීම සඳහා උක්ත 3.2.2.1 හි සඳහන් ක්‍රමවේදය අනුගමනය කර ආකර්ශණය කරගත් අයදුම්පත් 40ක් අතරින් මූලික සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්පත් 35ක් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට තෝරා ගන්නා ලදි.

- අරමුදල් කාර්යාලයේ පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මාළාවට පෙනී සිටි අයදුම්කරුවන් 17 දෙනකුගෙන් ඉහළ ලකුණු ලබා ගත් 6 දෙනෙකු තෝරා රිය පැදවීමේ හැකියාව මිණීමේ ප්‍රායෝගික පරීක්ෂණයට ලක් කිරීමට කැඳවන ලද මුත් අයදුම්කරුවන් දෙදෙනෙක් පමණක් එම ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටි අතර සියළු සුදුසුකම් සම්පූර්ණ කර ප්‍රායෝගික පරීක්ෂණය සමත් වූ අයදුම්කරු 2023.05.12 දින සිට රියැදුරු තනතුරට පත් කරන ලදි.

- ඒ අනුව 2023 වසරේදී නවක බඳවා ගැනීම් 12ක් සිදු කරන ලදි. කළමනාකරණ සහකාර තනතුර සඳහා 11 දෙනෙකුද රියැදුරු තනතුර සඳහා 01 අයෙකුද වශයෙන් නවක පත්වීම් 12ක් ලබා දෙන ලදි.

- 2023 වසර අවසානයේදී අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලයේ කණිෂ්ඨ කළමනාකාර - තොරතුරු තාක්ෂණ 01 එක් තනතුරක්ද කළමනාකරණ සහකාර (තාක්ෂණික) -ගොඩනැඟිලි අධීක්ෂක 01 එක් තනතුරක්ද කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරු 04 ක් ද කාර්යාල සහායක තනතුරු 01 ක් ද වශයෙන් පුරප්පාඩු 07ක් විය.

3.3 අරමුදල් පරිශ්‍රය නඩත්තු කිරීම

3.3.1 අරමුදල් පරිශ්‍රයේ අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු

- <u>අරමුදල් කාර්යාලයේ විදුලි තත්ඇදීමේ කාර්යය</u>

1960 දශකයේ ඉදිකරන ලද අරමුදල් කාර්යාලයේ වත්මන් විදුලි පරිපථය මේ වන විට දැඩි අවදානම් තත්වයට පත්ව ඇති බවත් එහි සමහර කොටස් වරින් වර අක්‍රිය තත්වයට පත්වීම හේතුවෙන් තවදුරටත් විදුලි තතැදුම් පද්ධතිය පවත්වාගෙන යාමේ අවදානම සැළකිල්ලට ගෙන කඩිනමින් එය ප්‍රතිසංස්කරණය කිරීමේ අත්‍යාවශ්‍යතාවය භාරකාර මණ්ඩලයේ අවධානයට යොමුවිය. අරමුදල් කාර්යාලයේ විදුලිය තතැදීමේ ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවාව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ උපදේශන කාර්යාංශය විසින් සපයනු ලැබූ අතර විධිමත් ප්‍රසම්පාදන කටයුතු අනුගමනය කර අරමුදල් කාර්යාලයේ විදුලි තතැදීමේ කාර්යය 2023 වසරේ සැප්තැම්බර් 07 වන විට අවසන් කරන ලදි.

- <u>කාර්යාලයේ දුරකථන අභ්‍යන්තර දිගු ජාලය නැවත ස්ථාපනය කිරීම.</u>

අරමුදල් කාර්යාලයේ කාර්යක්ෂම සේවා දායකත්වයට බාධාවක්ව තිබූ අභ්‍යන්තර දිගු දුරකථන ජාල පද්ධතියේ අක්‍රීයභාවය යථාවත් කිරීම සඳහා විධිමත් ප්‍රසම්පාදන පිලිවෙත් අනුගමනය කර වෙළඳ පොළ ඉහළ විශ්වසනීයත්වයක් සහ ප්‍රමුඛස්ථානය දිනා සිටින ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත අභ්‍යන්තර දුරකථන දිගු ජාල පද්ධතිය ස්ථාපනය කර පවත්වා ගැනීමේ කොන්ත්‍රාත්තුව භාරදෙන ලදි.

3.4 කාර්ය මණ්ඩල පරිපාලන හා කාර්යාලීය ක්‍රමවේදයන් විධිමත් කිරීම.

- **අරමුදලේ සංවිධාන ව්‍යුහයේ කණිෂ්ඨ කළමනාකාර නව තනතුරක් ස්ථාපිත කිරීම**

අරමුදලේ කාර්යභාරය පුළුල් වීම පදනම් කරගෙන අරමුදලේ සේවා දායකයන්ට වඩාත් ඵලදායී කාර්යක්ෂම සේවාවක් පිරිනැමීම සඳහා අරමුදලේ පවතින කාර්ය භාරය සඳහා අවශ්‍ය වන අධීක්ෂණ තනතුරු වල අත්‍යාවශ්‍යතාවය හඳුනාගෙන විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත ණය අංශයේ අධීක්ෂණ තනතුරක් ස්ථාපිත කිරීමට භාරකාර මණ්ඩලය අනුමත කරන ලදුව අරමුදලේ සේවා අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන ණය අංශය සඳහා ණය අධීක්ෂක (කණිෂ්ඨ කළමනාකාර) තනතුරු - 01 ස්ථාපිත කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ මුදල් අමාත්‍යාංශයීය අනුමැතිය ලදී.

- **වාර්ෂික කාර්ය සාධන ඇගයීම**

කාර්ය මණ්ඩලයේ කාර්ය සාධන ඇගයීමේ දී අංශ ප්‍රධානීන් විසින් ලබා දෙන ලකුණු සීමාවන් සැලකිල්ලට ගෙන ලකුණු 90 ට වැඩියෙන් ලබා ගෙන ඇති නිළධාරීන් තනතුරු මට්ටමට අනුව වෙන් වෙන් වශයෙන් තෝරාගෙන සේවය ඇගයීමේ සහතික පතක් නිකුත් කිරීමට භාරකාර මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

වර්ෂයකට එක් වරක් පමණක් අරමුදල් භාරකාර මණ්ඩලය සහ පාලන භාරකාරතුමියගේ ප්‍රධානත්වයෙන් මෙම සේවා ඇගයීමේ සහතිකය නිකුත් කිරීමට අනුමැතිය ලදි.

- **පිරිමැසුම්දායක ක්‍රමවේද භාවිතයෙන් කඩදාසි හිඟය කළමනාකරණය කර ගැනීම**

වර්තමානයේ පවතින කඩදාසි හිඟය සහ කඩදාසි මිල ගණන් සැලකිල්ලට ගෙන භාරකාර මණ්ඩල රැස්වීම් ලිපිගොනුව මින් ඉදිරියට මෘදුකාංග පිටපතක් වශයෙන් සියළුම භාරකාර මණ්ඩල සාමාජිකයන් වෙත විද්‍යුත් තැපෑලෙන් යොමු කිරීමටත් රැස්වීම පවත්වන දිනයේදී සාකච්ඡා කිරීමට නියමිත මාණ්ඩලික පත්‍රිකා, ගිණුම් වාර්තා ආදිය රැස්වීම් ශාලාවේ ප්‍රොජෙක්ටරය භාවිතා කර තිරයක් මත ප්‍රදර්ශනය කිරීමෙන් සාකච්ඡාවට ලක් කිරීමටත් පිටපත් ගොනු සැකසීමේ අවශ්‍යතාවය මත මුල්පිටපත පමණක් ගොනුගත කර අරමුදල් කාර්යාලයේ පවත්වා ගෙන යාමටත් තීරණය විය.

- **අරමුදලේ 96 වන වර්ෂ පූර්ණ සැමරුම**

ලෝහෝර් ආර්යා ණය අරමුදලේ 96 වන සංවත්සරය සැමරීම වෙනුවෙන් ණය බරින් ජනතාව මුදවාලීම සඳහා තම පෞද්ගලික ධනයෙන් අරමුදලක් පිහිටුවා ජනතා සේවයට කැප වූ ජීන් ලෝහෝර් ආර්යාව සිහි කර එතුමියට පිං අනුමෝදන් කිරීම සඳහා අරමුදලේ භාරකාර මණ්ඩලය, පාලන භාරකාර තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියළු දෙනාගේම සහභාගීත්වයෙන් 2023.03.27 වන දින පස්වරු 3.00 ට කොටුව සම්බෝධි විහාරස්ථානයේ දී බෝධිපූජාමය පිංකමක් සාර්ථකව පවත්වන ලදී.

ලෝහෝර් ආර්යා ණය අරමුදලේ 96 වන සංවත්සරයේ විශේෂ අවස්ථා

















3.5 කාර්ය මණ්ඩල ණය

- කාර්ය මණ්ඩල සේවකයින්ගේ හදිසි අවශ්‍යතාවයන් වෙනුවෙන් ඔවුන්ගේ වේතනයෙන් 40% සීමාව පවතින්නේ නම්, රු. 250,000/- ක් හා රු. 100,000/- ක් යන ණය වර්ග 2 යටතේම කාර්ය මණ්ඩලය වෙත ණය ලබා දීමට භාරකාර මණ්ඩලය තීරණය කරන ලද අතර 2023.08.29 දින සිට එම ක්‍රමවේදය කාර්ය මණ්ඩලය තුළ ක්‍රියාත්මක කරන ලදී.

- පූර්වයෙන් 10% පොළී ප්‍රතිශතය යටතේ කාර්ය මණ්ඩලයට නිකුත් කර ඇති රු.250,000/- සහ රු.100,000/- ණය මුදල් කාණ්ඩ දෙකෙන් එක් ණය වර්ගයක් පමණක් ගැනීමට ස්ථාපිත කර තිබූ නීතිය අහෝසි කර එක් සේවකයකුට මෙම ණය කාණ්ඩ දෙකම යටතේ ණය මුදල් ලබා ගැනීමට හැකිබව ස්ථාපනය කරන ලදී.

<u>අරමුදලේ ණය ක්‍රමය යටතේ ස්ථාපිත සංශෝධිත නව කොන්දේසි.</u>

- 2023 ජනවාරි 02 වන දින සිට අරමුදලේ ණය පොළී ප්‍රතිශතය 15% දක්වා වැඩි කරන ලදී. පැවතුනු බැංකු පොළී අනුපාතිකයට සමගාමීව අරමුදලේ පොළී අනුපාතිකය වැඩි කළත් වෙළඳපොළ බැංකු ණය පොළී අනුපාතය අඩු කළ විගසම අරමුදලේ පොළී අනුපාතය ද අඩු කිරීමට යටත් ව මෙම පොළී ප්‍රතිශතය වැඩි කිරීම සිදු කරන ලදී.
- පවතින අධික ණය ඉල්ලුම, ඇප අත්සන් කිරීමට කැඳවන දිනය මාස 3 ක් දක්වා දීර්ඝ වීම සහ පවතින සීමිත ප්‍රතිපාදන සියළුම ණය අයදුම්කරුවන් වෙත බෙදි යන සේ ණය ලබා දීම යනාදි කරුණු පාදක කර 2023.03.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඕනෑම ණය අයදුම්කරුවකුට වලංගු වන සේ අරමුදලින් ලබාදෙන උපරිම ණය සීමාව රු. 100,000/- ලෙස සංශෝධනය කරන ලදී.
- 2023.10.05 දින සිට අරමුදල මඟින් ලබාදෙනු ලබන උපරිම ණය මුදල වන රු. 100,000/- ක ණය මුදල් සීමාව රු. 200,000/- ක උපරිම ණය සීමාව දක්වා වැඩි කරන ලදී. එනමුත් පූර්වයෙන් රු. 250,000/- ක ණය කාණ්ඩය සඳහා සුදුසුකම් ලත් අයට පමණක් රු. 200,000/- ණය වර්ගය 2023.10.05 දින සිට නිකුත් කරන ලදී.
- එමෙන්ම 2023 ඔක්තෝබර් මස සිට රු. 100,000/- සීමාව දක්වා තිබූ ණය කාණ්ඩ සියල්ල ක්‍රියාත්මක කරන ලදී.
- අරමුදලේ ක්‍රියාත්මක කරනු ලබන විධිමත් ණය ක්‍රියා පටිපාටියට අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිළධාරීන් වෙතද ණය ලබා දීමට භාරකාර මණ්ඩලය විසින් තීරණය කර අනුමැතිය ලබා දෙන ලදී.

3.6 ඉඩම් ඔප්පු සහ බැදුම්කර.

අරමුදල ආරම්භ කළ අවධියේදී, ඉඩම් (ඔප්පු) ඇපයට තබා ණය ලබා ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වී ඇත. මෙම ක්‍රමය යටතේ ණය ලබා දුන් ඇප බැදුම්කර 267 ක් 1960 වසරේ සිට මෙම ආයතනයේ පවතී. මෙම ක්‍රමය යටතේ ණය දීම තවදුරටත් ක්‍රියාත්මක නොවන බැවින් විධිමත් විගණන කමිටු නිර්දේශයකින් අනතුරුව, එම බැදුම්කර අදාළ දේපළ පිහිටා ඇති ප්‍රදේශ අනුව එම දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලට බැදුම්කර නිදහස් කර ඒවායේ සඳහන් පාර්ශවයන් නමින් එකී අවලංගු කිරීම් ලියාපදිංචි කර තවදුරටත් මෙම ආයතනය වෙත පැවරී ඇති වගකීම අවසන් කිරීමට 831 වන භාරකාර මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. ඊට අදාලව බැදුම්කර 191 ක් නිදහස් කර ඇත.

මීට අමතරව පූර්වයෙන් අරමුදලින් නිදහස් කරන ලද බැදුම්කර, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් අවලංගු කර නොගැනීම හේතුවෙන් විවිධ අවස්ථාවලදී ඉදිරිපත් වන අයදුම්කරුවන් විසින් යොමු කරන ලද ඉල්ලීම් හා පත්තිරුවලට අදාලව නව බැදුම්කර සකස්කර අරමුදලින් නිදහස් කර දි ඇත. **2023.01.01 සිට 2023.12.31 දින දක්වා කාලය තුළ එවැනි අයදුම්කරුවන් තිදෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද පත්තිරු වලට අදාලව නව බැදුම්කර සකස් කර අරමුදලින් නිදහස් කර ඇත.**

- රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ ලිඛිත උපදෙස් පරිදි ඇවර කර ඇති ණය සහන සභාවේ ඉඩම් උකස්කර නිදහස් කිරීමට අදාල අයවලුන් දැනුවත් කිරීම සඳහාද අරමුදලේ පවතින සියලුම ඇප ඔප්පු බැදුම්කර නිදහස් කිරීම ප්‍රවලිත කිරීම සඳහා ද අරමුදල් වෙබ් අඩවියේ දැන්වීමක් පළ කරන ලදී.

- විස්තර ලබා ගැනීමේ අයදුම්පත, අදාල දිවුරුම් ප්‍රකාශ සහ ලේඛන සියල්ල මීට ඇතුළත් කරන ලදි.

- ඇවර කරන ලද ණය සහන සභාවට අදාල ඇප/ බැදුම්කර/ ඔප්පු සම්බන්ධ දැන්වීම / අයදුම්පත සහ ඥාතිත්වය තහවුරු කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළයුතු දිවුරුම් ප්‍රකාශය යන ලේඛන ත්‍රෙභාෂාවෙන් අරමුදලේ වෙබ් අඩවියේ පළ කිරීමට වැඩිදුරටත් කටයුතු කරන ලදි.

3.7 භාරකාර මණ්ඩල රැස්වීම.

2023 වසර තුළ භාරකාර මණ්ඩල රැස්වීම් 12ක් පවත්වන ලදි.

අරමුදලේ භාරකාර මණ්ඩලයේ පුරප්පාඩු තනතුරු දෙකක් සඳහා 2023.08.28 වන දින සිට නව භාරකාරවරියන් දෙපළක් පත්වන ලදි. මුදල් අමාත්‍යාංශයේ ආයතනික කටයුතු අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා අනුරාධා ගල්ලන්ගොඩ මහත්මියත් නියෝජ්‍ය අධ්‍යක්ෂිකා පී. ඒ. ඩී. පී. විජේරත්න මහත්මියත් භාරකාරවරු ලෙස පත්වන ලදි.

3.8 විගණන හා කළමනාකරණ කමිටුව.

2023 වසරේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03ක් පහත සඳහන් පරිදි පවත්වන ලදි. විමසුම් සම්බන්ධ ලේඛන විගණක කමිටුවේදි සාකච්ඡා කර භාරකාර මණ්ඩලයේ උපදෙස් සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. එමෙන්ම එකී විමසුම් වාර්තා වලින් පැන නැගුන වැදගත් කරුණු භාරකාර මණ්ඩල අනුමැතිය යටතේ ක්‍රියාත්මක කරන ලදි.

අනු අංකය	කමිටු පැවැත්වූ දිනය
01	2023.03.22
02	2023.06.22
03	2023.10.11

04

අනාගත සැළසුම්

- වර්තමානයේ රාජ්‍ය සේවකයන්ට පමණක් සපයනු ලබන ලෝහෝර් ආර්යා ණය අරමුදලේ මූල්‍ය පහසුකම් අනාගතයේ දී පෞද්ගලික අංශයේ සේවකයින්ට ද ලබා දීමට හැකි වන පරිදි මුදල් උත්පාදනය කර ගැනීම සඳහා ලෝහෝර් ආර්යා අරමුදල් පනතේ වගන්ති වර්තමානයට ගැලපෙන අයුරින් සංශෝධනය කිරීම.

- අරමුදලින් ක්‍රියාත්මක ණය ක්‍රමවේදය වර්තමානයේදී මධ්‍යගත තත්වයෙන් ක්‍රියාත්මක වන අතර එය දිවයිනේ පළාත් 9ක විමධ්‍යගත තත්වයෙන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සැළසුම් කර ඇත.

- අරමුදලේ මහල් බදු කුළියට ගෙන තම කාර්යාල පරිශ්‍ර පවත්වාගෙන යන ආයතනවලින් ඉදිරිපත් කරන අළුත්වැඩියා කටයුතු සඳහා වන ඉල්ලීම් කඩිනමින් නිම කර ඔවුන් තෘප්තිමත් කිරීමට කටයුතු කිරීම.

- අරමුදලේ මූල්‍ය ශක්‍යතාවය වැඩිවර්ධනය කිරීම.

05

අරමුණු සපුරාලීමට පවතින බාධාවන්

ලෝහෝර් ආර්යා ණය අරමුදල විසින් රාජ්‍ය සේවකයන් වෙත නිකුත් කරනු ලබන ණය මත උපයන පොලිය 2009 ජාතික අයවැය ලේඛනය වෙත යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කර ආදායම් බද්දෙන් නිදහස් කරගැනීමට ක්‍රියාකර ගනිමින් එලෙස ඉතිරි කරගන්නා බදු ආදායම ද අරමුදලේ ප්‍රධාන පරමාර්ථය වන රාජ්‍ය සේවකයන් වෙත ණය නිකුත් කිරීම වෙනුවෙන් යොදාගැනීම සිදු වූ අතර 2017 නව ආදායම් බදු පනත ක්‍රියාත්මක වීමත් සමඟම එම බදු සහනය අහෝසි වීමෙන් අරමුදලේ සමස්ත ආදායමෙන් වියදම් අඩු කිරීමෙන් පසුව 18% ක හා වර්තමානයේ දී 30% ක ප්‍රතිශතයක් යටතේ ආදායම් බදු ගෙවීම සිදුවීම මත වර්ෂයකට රු.මිලියන 26 ක් පමණ ආදායම් බදු ලෙස වැය කිරීමට සිදු වී ඇත.

භාණ්ඩාගාරය/ජාතික අයවැය ලේඛනය මඟින් කිසිදු මූල්‍ය ප්‍රතිපාදනයක් නොලබා මෙම අරමුදල මඟින්ම සම්පාදනය කරගනු ලබන මූල්‍ය ප්‍රතිපාදන මඟින් පොදු කාර්යය සහ ප්‍රාග්ධන වියදම් ද ණය නිකුත් කිරීමේ ප්‍රතිපාදන ද සපයාගනු ලබන මෙම ආයතනයට එලෙස කලින් ලබා දී තිබූ ආදායම් බදු සහනය අහෝසි වීම මත හා 18%,30% වැනි ඉහල ප්‍රතිශතයක් යටතේ වර්තමානයේ දී බදු ගෙවීමට සිදුවීම හේතුවෙන් දැරීමට සිදුවන අතිරේක පිරිවැය හේතුවෙන් මීටත් වඩා පුළුල්ව රාජ්‍ය සේවකයන් වෙත සහන සැලසීමට පැවති හැකියාව යම් ප්‍රමාණයකින් සීමා වී ඇත.තව ද සමාජ ආරක්ෂණ බදු හා සෙසු අතිරේක බදු හේතුවෙන් එම තත්ත්වය තවදුරටත් වර්ධනය වී ඇත.

2009 ජාතික අයවැය ලේඛනයෙන් මෙම අරමුදලට ලබා දී තිබූ එකී ආදායම් බදු සහනය නැවත මෙම ආයතනය වෙත ලබාදෙන මෙන් අවස්ථා කිහිපයකදී ම ඉල්ලීම් කර ඇති අතර එපරිද්දෙන් මෙම ආයතනය වෙත නැවතත් බදු සහනය ලබාදුනහොත් මීටත් වඩා පුළුල්ව මෙහි සේවාව ව්‍යාප්ත කල හැකි බව පෙන්වා දිය හැක.

ස්වාධීන විගණකගේ වාර්තාව
ලෝහෝර් ආර්යා ණය අරමුදල් සාමාජිකයන් වෙත

මූල්‍ය ප්‍රකාශන විගණනය මත වාර්තාව

මතය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය තත්ව ප්‍රකාශනය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයන් සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත ලෝහෝර් ආර්යා ණය අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී.

2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර.) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව අප විසින් දරන්නා වූ මතය වේ.

මතය සඳහා පදනම

අප විසින් අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (ශ්‍රී.ල.වි.ප්‍ර.) අනුකූලව සිදු කරන ලදී. එම ප්‍රමිතීන්ට අනුකූලව අපගේ වගකීම් පිළිබඳව අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම යන ඡේදය යටතේ වැඩිදුරටත් විස්තර කෙරේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආචාර ධර්ම සංග්‍රහයේ සඳහන් ආචාර ධර්ම අවශ්‍යතාවයන්ට අනුකූලව අපගේ මූල්‍ය ප්‍රකාශන විගණනයට අදාළ වන පරිදි අප අරමුදලෙන් ස්වාධීන විගණකවරු ලෙස කටයුතු කරන අතර, ආචාර ධර්ම සංග්‍රහයේ දැක්වෙන අනෙකුත් වෘත්තීය ආචාර ධර්මයන්ට අනුකූලව ද අප විසින් කටයුතු කර ඇත. අප ලබා ගත් විගණන සාක්ෂි අපගේ මතය සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය බව අප විශ්වාස කරමු.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ කළමනාකාරීත්වයේ සහ පාලනය පිළිබඳ වගකිව යුතු පාර්ශවයන්ගේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකාරීත්වයේ වගකීම වන අතර, එකී මූල්‍ය ප්‍රකාශන වංචා හා වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු වීම සඳහා අවශ්‍යයැයි හැඟෙන අභ්‍යන්තර පාලනයන් හඳුන්වා දී භාවිතා කිරීමට ද කළමනාකාරීත්වය වගකීමෙන් බැඳේ.

ආයතනය ඇවර කිරීමට හෝ මෙහෙයුම් කටයුතු නැවැත්වීම තීරණය කර ඇති විටක හෝ ඉහත විකල්පයන් හැර වෙනත් විකල්පයක් නොමැති අවස්ථාවක හැර ආයතනය විසින් අඛණ්ඩ පැවැත්ම උපකල්පනයට අනුකූලව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම කළමනාකාරීත්වයේ වගකීම වේ.

මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම, සමාගමේ පාලනය පිළිබඳ වගකිව යුතු පාර්ශවයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ අපගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම අපගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මූල්‍ය ප්‍රකාශනවල විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් පිළිබඳ වැඩිදුර විස්තර කිරීමක් ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති කමිටුවේ වෙබ් අඩවිය වන :
http://slaasc.com/auditing/auditorsresponsibility.php හි දක්වා ඇත. මෙම විස්තරය අපගේ විගණක වාර්තාවේ කොටසකි.

වරලත් ගණකාධිකාරීන්
දිනය : 2024/07/01
රාජගිරිය

2023 දෙසැම්බර් 31 දිනට
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

	සටහන	31/12/2023	31/12/2022
		රු.	රු.
පොලී ආදායම	**5**	96,967,815	57,862,585
අනෙකුත් ආදායම්	**6**	48,103,063	55,713,743
		145,070,878	**113,576,327**
මෙහෙයුම් වියදම්			
පුද්ගල වැටුප් වියදම්	**7**	(39,174,991)	(34,356,814)
භූමිය, උපකරණ, ආයතනික වියදම්	**8**	(21,792,000)	(16,841,466)
ගාස්තු සහ කොමිස්	**9**	(427,854)	(1,881,816)
		(61,394,845)	**(53,080,095)**
බදුකරණයට පෙර ලාභය		**83,676,033**	**60,496,232**
බදු වියදම්	**10**	**(26,277,492)**	**(15**,818,536)
වර්ෂය සඳහා ලාභය		**57,398,541**	**44,677,696**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් සම්බන්ධ කර කියවිය යුතුයි. එමෙන්ම සටහන් මූල්‍ය ප්‍රකාශන වල අත්‍යවශ්‍ය අංගයක් වේ.

ලෝහෝර් ආර්යා ණය අරමුදල
2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

	සටහන	31/12/2023	31/12/2022
		රු.	රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	11	82,815,709	79,785,213
ආයෝජන (දේපල)	12	23,276,187	24,266,664
		106,091,896	**104,051,876**
ස්ථාවර තැම්පතු මත ආයෝජනය	13	97,497,665	182,607,160
ජංගම වත්කම්			
භාණ්ඩ ලේඛණ	14	1,273,701	1,085,436
අනෙකුත් වත්කම්	15	5,837,524	14,943,465
ණය සහ අත්තිකාරම්	16	638,174,739	500,930,482
මූල්‍යමය හා කෙටි කාලීන වත්කම්	17	27,095,541	12,158,144
		672,381,505	**529,117,527**
මුළු වත්කම්		**875,971,066**	**815,776,563**
අරමුදල්,සංචිත සහ වගකීම්			
සමුච්චිත අරමුදල		679,102,146	621,694,922
ප්‍රත්‍යා ගණන සංචිත		146,649,586	146,649,586
මුළු අරමුදල් හා සංචිත		**825,751,732**	**768,344,508**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	18	24,043,956	22,579,760
		24,043,956	**22,579,760**
ජංගම වගකීම්			
අනෙකුත් වගකීම්	19	12,308,953	14,572,893
ආදායම් බදු	20	13,866,425	10,279,402
		26,175,378	24,852,295
මුළු වගකීම්		**50,219,334**	**47,432,055**
මුළු අරමුදල්,සංචිත සහ වගකීම්		**875,971,066**	**815,776,563**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් සම්බන්ධ කර කියවිය යුතුයි. එමෙන්ම සටහන් මූල්‍ය ප්‍රකාශන වල අත්‍යවශ්‍ය අංගයක් වේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇති බවට මින් සහතික වෙමි.

.....
ගණකාධිකාරි

මෙම මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම භාරකාර මණ්ඩලය විසින් දරනු ලැබේ.

භාරකාර මණ්ඩලය වෙනුවෙන් අත්සන්





.....
සභාපති
දිනය : 2023.06.01

.....
පාලන භාරකාර
දිනය : 2023.06.01

	ප්‍රත්‍යා ගණන සංචිතය	සමුච්චිත ලාභය රු.	මුළු ශුද්ධ වත්කම් රු.
2022.01.01 දිනට ශේෂය	146,649,586	576,887,093	**723,536,679**
පෙර වසර සඳහා වූ ගැලපීම්	-	130,134	130,134
වසරේ ලාභය	-	44,677,696	44,677,696
2022.12.31 දිනට ශේෂය	**146,649,586**	**621,694,922**	**768,344,508**
2023.01.01 දිනට ශේෂය	146,649,586	621,694,922	**768,344,508**
පෙර වසර සඳහා වූ ගැලපීම්	-	8,683	8,683
වසරේ ලාභය	-	57,398,541	57,398,541
2023.12.31 දිනට ශේෂය	**146,649,586**	**679,102,146**	**825,751,732**

	2023/12/31 රු.	2022/12/31 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
වසරේ ශුද්ධ ලාභය	83,676,033	60,496,232
ගැලපීම්		
ක්ෂය	5,079,275	4,392,573
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	3,551,926	(116,285)
පෙර වසර සඳහා වූ ගැලපීම්	8,683	130,134
වත්කම් බැහැර කිරීම මත ලාභය	-	-
ඉතුරුම් මත පොලී ආදායම	(1,695,738)	(45,774)
ස්ථාවර තැම්පතු මත පොලී ආදායම	(24,701,680)	(35,520,016)
මෙහෙයුම් වත්කම් වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය	**65,918,500**	**29,336,864**
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහය		
භාණ්ඩ ලේඛන (වැඩිවීම්/අඩුවීම්)	(188,265)	(759,881)
ණය සහ අත්තිකාරම් (වැඩිවීම්/අඩුවීම්)	9,105,941	(283,701,641)
අනෙකුත් වත්කම් (වැඩිවීම්/අඩුවීම්)	(135,244,257)	(7,980,794)
අනෙකුත් වගකීම් (වැඩිවීම්/අඩුවීම්)	(2,263,940)	(520,101)
	(130,590,521)	**(292,962,417)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	(64,672,022)	(263,625,553)
පාරිතෝෂි ගෙවීම්	(2,087,730)	-
බදු ගෙවීම්	(22,690,469)	(11,043,610)
	(24,778,199)	**(11,043,610)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද/ භාවිතා කළ ශුද්ධ මූදල් ප්‍රවාහය	**(89,450,221)**	**(274,669,163)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම්	(7,119,295)	(3,223,622)
ආයෝජන වල (වැඩිවීම්/අඩුවීම්)	85,109,495	242,688,173
දේපල,පිරියත සහ උපකරණ විකිණීම	-	-
ලද පොලී	26,397,418	35,565,790
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**104,387,618**	**275,030,341**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
මුදල් හා සමාන දෑ වල ශුද්ධ (වැඩිවීම්/අඩුවීම්)	14,937,397	361,178
වර්ෂය ආරම්භයේ දී ඇති මුදල් හා ඒ සමාන දෑ	12,158,144	11,796,966
වර්ෂය අවසානයේ දී ඇති මුදල් හා ඒ සමාන දෑ	**27,095,541**	**12,158,144**
වර්ෂ අවසානයේ ශේෂ පතුය/ මුදල් සහ ඒ හා සමාන දෑ		
තැම්පතු මුදල්	27,076,158	12,138,144
අතැති මුදල්	19,383	20,000
	27,095,541	**12,158,144**

ලෝහෝර් ආර්යා ණය අරමුදල

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්

ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති

01. පොදු

1951 අංක 38 දරන ලෝහෝර් ආර්යා ණය අරමුදලේ (භාරකාර මණ්ඩලය) පනත (1956 සංශෝධිත) මඟින් ස්ථාපනය කරන ලද ලෝහෝර් ආර්යා ණය අරමුදල ශ්‍රී ලංකාවේ නිත්‍යවාසික අරමුදලකි. අරමුදලෙහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 02, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතෙහි අංක 100,3/2 දරණ ස්ථානයේ පිහිටා ඇත.

1.1 අනුකූලතා ප්‍රකාශණය

මූල්‍ය ප්‍රකාශණ පිළියෙළ කර ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලවය. (SLPAS)

1.2 මූල්‍ය ප්‍රකාශණ සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශණ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා භාරකාර මණ්ඩලය වගකීම දරයි.

1.3 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශණ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

1.4 ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

සියළුම ද්‍රව්‍ය පශ්චාත් ශේෂපත්‍ර සිදුවීම් සැලකිල්ලට ගනු ලැබ ඇති අතර අවශ්‍යතන්හි මූල්‍ය ප්‍රකාශන සඳහා වූ අදාල සටහන් වල ගැලපුම් හෝ අනාවරණයන් සිදුකර ඇත.

1.5 බදු

වර්තමාන බදු
මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් වන ආදායම් බදු ගණනය ආදායම් බදු විධිවිධාන අනුකූලව ආදායම් හා වියදම් මුලද්‍රව්‍ය මත 2017 අංක 24 දරණ සංශෝධිත ආදායම් බදු පනතට අනුව සිදු කර ඇත.

1.6 ආනුශංගික තොරතුරු

ණය අරමුදලට අදාල වන ප්‍රතිපත්තීන් වෙනත් ආකාරයකින් විශේෂයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස, පූර්ව වර්ෂයේ යොදා ගන්නා ලද ප්‍රතිපත්තීන් හා අනුකූල වේ. ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීම පිණිස අවශ්‍ය අවස්ථාවන්හි දී පූර්ව වර්ෂයේ සංඛ්‍යා නැවත පිළියෙල කර තිබේ.

02. වත්කම් සහ එහි වටිනාකම් තක්සේරු කිරීමේ පදනම

2.1 බොල් ණය සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන

බොල් ණය සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන සපයනු ලබන්නේ භාරකරුවන් විසින් සිදුකරනු ලබන සමාලෝචන පදනම් කරගෙන වන අතර පාරිභෝගිකයින් සඳහා වූ ණය වාර්තාකරනු ලබන කාල සීමාව අවසානයේදී ඉදිරියට ගෙන යන ලද හිඟ ශේෂයෙන් සපයනු ලබන ප්‍රතිපාදන අඩු කර තිබේ.

2.2 ස්ථාවර තැන්පතු

නුදුරු අනාගතයේ දී කෙටිකාලීන වෙළඳාමක් සඳහා ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ස්ථාවර තැන්පතු සහ අනෙකුත් පොලී තැන්පත් සුරැකුම්පත් සඳහා වියදම් වශයෙන් එකතු කරනු ලැබේ.

2.3 දේපල පිරියත සහ උපකරණ

දේපල පිරියත සහ උපකරණ මිලදි ගැනීමේ පිරිවැය සහ ඒ මත යෙදෙන යම් වියදම් ද දක්වා තිබේ.මෙම වත්කම් පහත සඳහන් කර ඇති සමුච්චිත ක්ෂය කිරීම් අඩුකර ලැබෙන පිරිවැයට දක්වා ඇත.

ගොඩනැගිලි	4%
පරිගණක උපකරණ	25%
ගෘහ භාණ්ඩ සවි කිරීම්	10%
කාර්යාල උපකරණ	10%
විදුයුත් අනුසිහුම්	10%
මෝටර් රථ	25%

2008/09 වසරේ සිට ණය අරමුදල එහි ගිණුම්කරණ ප්‍රතිපත්තීන් වෙනස් කර ඇත්තේ වත්කම් මිලදී ගත් දින සිට ඒවා බැහැර කරන මාසය දක්වා ක්ෂය කිරීම පිණිසය.

2007/08 වසර සඳහා වර්ෂය තුලදි භාවිතා කරන ලද වත්කම් සඳහා ද ක්ෂය කිරීම සිදු නොකරන ලද අතර වත්කම් බැහැර කරන වසර තුළදි ද ක්ෂය කිරීම සිදු නොකරන ලදි.

2.4 අනෙකුත් ලැබිය යුතු දෑ

අනෙකුත් ලැබිය යුතු දෑ සඳහන් කර ඇත්තේ එම නිශ්කාශණය කිරීම සඳහා තක්සේරු කරන ලද ප්‍රමාණයට අනුවය.

2.5 මුදල් හා ඒ සමාන දෑ

මුදල් හා මුදල් සමාන අයිතම ඉල්ලුම් තැන්පතු සහ කෙටිකාලීන අධික ද්‍රවශීලතාවයෙන් යුතු ආයෝජන මුදල් අගයට සැලකිය යුතු වෙනසක් ඇති නොවන ආකාරයට මුදල් හුවමාරු කර ගත හැකි මූල්‍යමය වත්කම් ලෙස නිර්වචනය කර ඇත.

අරමුදල් ප්‍රවාහ ප්‍රකාශණය වක්‍ර ක්‍රමය භාවිතා කරමින් පිළියෙළ කර ඇත.

03. වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි දන්නා සියළුම වගකීම් ඉදිරිපත් කර තිබේ.

3.1 ප්‍රාග්ධන බැඳීම්

මූල්‍ය ප්‍රකාශන සඳහා අදාල සටහන් වල අරමුදලෙහි ප්‍රාග්ධන බැඳීම් අනාවරණය කර ඇත.

3.2 විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ

විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන සපයා ඇත. භාරකාර මණ්ඩලය විසින් යොදා ගනු ලබන පාරිතෝෂික සමීකරණයට අනුකූලව ප්‍රතිපාදන ගණනය කර තිබේ.

3.3 නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල.

ව්‍යවස්ථාපිත තත්ත්වයන් හා රෙගුලාසි මත ලෝහෝර් ආර්යා ණය අරමුදල් කාර්ය මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක වී ඇත. අරමුදල විසින් 16% සේවක අර්ථසාධක අරමුදල සඳහා දායකත්වයක් ද, 3% සේවක භාරකාර අරමුදල සඳහා දායකත්වයක් ද සෑම සාමාජිකයෙකු වෙනුවෙන්ම දරනු ලබයි.

04. ආදායම් ප්‍රකාශනය

4.1 ආදායම් හඳුනා ගැනීම

4.1.1 ණය පොලී ආදායම

ණය පොලී ආදායම උපචිත පදනම මත ගණනය කර ඇත.

රාජ්‍ය අංශයේ සේවකයන්ට ලබාදුන් ණය වලින් මාස 03 ක් සඳහා ණය ප්‍රතිපාදන නොලැබුණු ක්‍රියාකාරී නොවන ණය පිළිබඳ අරමුදල අවධානය යොමු කරන අතර ඉන් පසුව එම ණය මත ලැබෙන පොළිය මුදල් පදනම මත ගණනය කරනු ලබයි.

4.1.2 බදු කුලී ආදායම

බදු ගිවිසුම මත අරමුදල් පරිශ්‍රයේ පදිංචිව සිටින කුලී නිවැසියන්ගේ ගොඩනැගිලි කුලී ආදායම උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

4.1.3 වියදම් හඳුනාගැනීම

ණය අරමුදල අබන්ධව පවත්වාගෙන යාමට සහ ස්ථාවර වත්කම් කාර්යක්ෂමව පවත්වාගෙන යාමෙහිලා ජනිත වන සියළුම වියදම් වසරේ ලාභය ගණනයේදී ආදායමෙන් අඩුකර පෙන්වයි.

යම් වත්කමක පවත්නා ස්වභාවය වැඩිදියුණු කිරීමට ව්‍යාප්ත කිරීමට වත්කමක් අත්පත් කර ගැනීම වෙනුවෙන් දරනු ලබන හෝ ණය අරමුදලෙහි ඉපයීම් ධාරිතාව වැඩිදියුණු කිරීමෙහිලා ජනිත වන සියළුම වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලබයි.

		31/12/2023	31/12/2022
		රු.	රු.
5	**ආදායම්**		
	රාජ්‍ය සේවකයින් සඳහා වූ ණය	95,948,787	56,901,010
	පොලී ආදායම් - 10% (රු.250,000/- කාර්ය මණ්ඩල ණය)	570,683	511,324
	නව කාර්ය මණ්ඩල ණය මත පොලී - 4.5%	308,510	318,194
	ටැබ් යන්ත්‍ර ණය මත පොලී	65,461	103,560
	පොලී ආදායම් - 10% (රු.100,000/- කාර්ය මණ්ඩල ණය)	71,652	26,734
	පාපැදි ණය මත පොලිය	1,401	147
	විශේෂ අත්තිකාරම් ණය මත පොලී	1,321	1,615
		96,967,815	**57,862,585**
6	**අනෙකුත් ආදායම්**		
	ස්ථාවර තැම්පතු සඳහා පොලිය	24,701,680	35,520,016
	කුලී ආදායම	19,810,613	19,261,141
	ඉතුරුම් මත පොලී ආදායම	1,695,738	45,774
	ණය අලාභ සඳහා වෙන් කිරීම්	847,715	-
	අයැදුම්පත් අලෙවියෙන් ලැබූ ආදායම	564,900	387,600
	අනෙකුත් ආදායම්	292,592	251,927
	විශේෂ ආදායම්	189,825	131,000
	විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදන	-	116,285
		48,103,063	**55,713,743**
7	**සේවක මණ්ඩල පිරිවැය**		
	වැටුප්	18,263,477	17,725,092
	විශේෂ අත්තිකාරම්	4,778,389	3,928,441
	දීමනාව (කාර්ය මණ්ඩල දීමනාව)	3,928,080	3,511,242
	පාරිතෝෂික දීමනා	3,551,926	-
	කාර්යාල සේවක අර්ථසාධක අරමුදල	3,541,088	3,477,280
	පාලන භාරකාරතුමියගේ දීමනාව	2,458,942	1,850,589
	වාර්ෂික ප්‍රසාද දීමනා	642,292	1,452,500
	සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල	663,954	651,990
	භාරකාර මණ්ඩල සාමාජික දීමනා	516,663	485,757
	සභාපති දීමනාව	399,457	392,947
	කරුණාසහගත දීමනා ගෙවීම	166,200	-
	විගණන කමිටුව	91,432	120,190
	අතිකාල	90,229	41,600
	නිළ ඇඳුම්	69,759	62,233
	කාර්ය මණ්ඩල පුහුණු	6,600	-
	නිහ වැටුප්	6,503	80,670
	පාලන භාරකාරතුමියගේ ඉන්ධන දීමනාව	-	541,285
	විශේෂ ප්‍රවාහන දීමනා	-	35,000
		39,174,991	**34,356,814**

		31/12/2023	31/12/2022
		රු.	රු.
8	**පරිශ්‍රය, උපකරණ සහ ස්ථාපිත වියදම්**		
	ක්ෂය වීම	5,079,275	4,392,573
	මුද්‍රණය හා ලිපි ද්‍රව්‍ය	3,504,762	2,468,094
	ආරක්ෂක ගාස්තු	2,350,293	2,044,390
	වරිපනම් සහ රජයේ ඉඩම් සඳහා බදු	2,331,357	1,865,082
	විදුලිය	2,277,431	1,064,294
	නඩත්තු - පරිගණක	1,501,456	1,281,465
	සනීපාරක්ෂක ගාස්තු	901,161	795,782
	ඉන්ධන සහ මෝටර් රථ ගාස්තු	819,128	566,649
	තැපැල් හා විදුලි පණිවිඩ	548,965	349,853
	නඩත්තු - කාර්යාල උපකරණ	544,428	519,678
	දුරකථන	480,769	413,503
	නඩත්තු - විදුලි සෝපාන	386,669	251,850
	නඩත්තු - ගොඩනැගිලි	377,356	36,433
	ජලය	182,221	95,115
	නිල බංගලා වියදම්	136,209	11,275
	පරීක්ෂාකිරීමේ ගාස්තු	122,840	397,440
	ප්‍රචාරණ වියදම්	106,575	-
	පුවත්පත් හා වාරප්‍රකාශන	65,640	45,840
	මුද්දර ගාස්තු	57,275	49,200
	කාර්ය මණ්ඩල සුබ සාධන - නිළ ඇඳුම්	9,452	2,655
	රජයේ ඉඩම් බදු	5,000	5,000
	පරිත්‍යාග	2,500	63,000
	ප්‍රවාහන	1,238	1,780
	ගොඩනැගිලි රක්ෂණ	-	120,514
		21,792,000	**16,841,466**
9	**ගාස්තු සහ කොමිස් මුදල්**		
	නීති ගාස්තු	263,017	12,800
	විගණන ගාස්තු	80,000	64,200
	වෘත්තීය ගාස්තු	62,500	205,000
	බැංකු ගාස්තු	22,337	26,894
	ණය අලාභ සඳහා ප්‍රතිපාදන	-	1,572,922
		427,854	**1,881,816**
10	**<u>බදු සඳහා වියදම්</u>**		
	<u>ව්‍යාපාරයෙන් උපයන ලද පොලිය මත ලාභය</u>		
	බදු පෙර ලාභය	**83,676,033**	**60,496,232**
	අනෙකුත් ආදායම්	**(839,032)**	**3,715**
	බදු වලින් හිලව් කිරීමට එකඟ වී ඇති වියදම්	8,769,910	6,101,770
	බදු වලින් අඩු කිරීමට හැකි වියදම්	(4,015,270)	(691,149)
	ව්‍යාපාරයෙන් උපයන ලද පොලිය මත ලාභය	**87,591,642**	**65,910,568**
	මුළු බදු ආදායම	**87,591,642**	**65,910,568**
	ආදායම් බදු වියදම් 18%	-	5,931,951
	ආදායම් බදු වියදම් 30%	26,277,492	9,886,585
		26,277,492	**15,818,536**

11	දේපළ, පිරියත හා උපකරණ පිරිවැය	2023.01.01 දිනට ශේෂය රු.	වසර තුල දී ගැලපීම් රු.	වසර තුල දී ඉවත් කිරීම් රු.	2023.12.31 දිනට ශේෂය රු.
	සින්නක්කරය				
	ගොඩනැගිලි	10,400,000	-	-	10,400,000
	මෝටර් රථ	16,008,750	-	-	16,008,750
	විදුලි උපකරණ හා සිහුම් (සවිකිරීම්)	5,215,270	7,020,475	-	12,235,745
	පරිගණක උපකරණ	6,737,770	-	-	6,737,770
	ගෘහ භාණ්ඩ හා සවි කිරීම	1,444,168	36,841	-	1,481,009
	කාර්යාල උපකරණ	3,153,362	61,978	-	3,215,340
	බදු ඉඩම්	98,000,000	-	-	98,000,000
		140,959,319	**7,119,295**	**-**	**148,078,614**

	සමුච්චිත ක්ෂය	2023.01.01 දිනට ශේෂය රු.	වර්ෂය සඳහා ගාස්තු රු.	වසර තුල දී ඉවත් කිරීම් රු.	2023.12.31 දිනට ශේෂය රු.
	සින්නක්කර				
	ගොඩනැගිලි	8,666,664	247,619	-	8,914,283
	මෝටර් රථ	15,982,531	26,219	-	16,008,750
	විදුලි උපකරණ හා සිහුම් (සවිකිරීම්)	3,534,886	684,829	-	4,219,715
	පරිගණක උපකරණ	4,636,046	481,627	-	5,117,673
	ගෘහ භාණ්ඩ හා සවි කිරීම	1,095,480	95,210	-	1,190,690
	කාර්යාල උපකරණ	1,591,833	219,961	-	1,811,794
	බදු ඉඩම්	25,666,667	2,333,333	-	28,000,000
		61,174,107	**4,088,798**	**-**	**65,262,905**
	ලියාභල අගය	**79,785,213**			**82,815,709**

12	ආයෝජන දේපළ පිරිවැය/ තක්සේරුව	2023.01.01 දිනට ශේෂය රු.	වසර තුල දී ගැලපීම් රු.	2023.12.31 දිනට ශේෂය රු.
	ආයෝජන දේපළ	41,600,000	-	**41,600,000**
		41,600,000	-	**41,600,000**

	සමුච්චිත ක්ෂයවීම	2023.01.01 දිනට ශේෂය රු.	වර්ෂය සඳහා ගාස්තු රු.	2023.12.31 දිනට ශේෂය රු.
	ආයෝජන දේපළ	**17,333,336**	990,477	**18,323,813**
		17,333,336	990,477	**18,323,813**
	ලියාභල අගය	**24,266,664**		**23,276,187**

			31/12/2023	31/12/2022
			රු.	රු.
13	**ස්ථාවර තැම්පතු මත ආයෝජන**			
	ස්ථාවර තැම්පතු - මහජන බැංකුව		97,497,665	118,840,782
	ස්ථාවර තැම්පතු - ජාතික ඉතිරි කිරීමේ බැංකුව සිටි ශාඛාව		-	63,766,379
			97,497,665	**182,607,160**
14	**භාණ්ඩ ලේඛණ**			
	ලිපිද්‍රව්‍ය ගබඩාව		700,070	831,508
	මුද්‍රිත ලිපිද්‍රව්‍ය		505,020	194,039
	විදුලි උපාංග		44,893	42,693
	සනීපාරක්ෂක ද්‍රව්‍ය		23,718	17,196
			1,273,701	**1,085,436**
15	**අනෙකුත් වත්කම්**			
	ස්ථාවර තැම්පතු මත පොලිය		2,935,524	12,259,394
	ලැබිය යුතු ගොඩනැගිලි කුලි		2,900,000	2,155,000
	පානීය ජල බෝතල් සඳහා තබා ඇති තැන්පතු මුදල		2,000	-
	ලැබිය යුතු ගොඩනැගිලි කුලි තැන්පතු		-	529,071
			5,837,524	**14,943,465**
16	**ණය සහ අත්තිකාරම්**			
	රාජ්‍ය ආයතන වල සේවකයන් සඳහා ණය	**16.1**	625,006,548	486,486,212
	කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්	**16.2**	13,168,191	14,444,270
			638,174,739	**500,930,482**
16.1	**රාජ්‍ය ආයතන වල සේවකයන් සඳහා ණය**			
	රාජ්‍ය සේවකයින්/ රාජ්‍ය සංස්ථා සඳහා ණය			
	ක්‍රියාකාරී ණය		611,610,664	477,264,926
	ක්‍රියාකාරී නොවන ණය		14,836,342	12,407,638
			626,447,006	**489,672,564**
	ක්‍රියාකාරී නොවන - ණය සඳහා විලම්බන පොලිය		(662,186)	(1,560,365)
	ණය අලාභ ප්‍රතිපාදන		(778,272)	(1,625,986)
			625,006,548	**486,486,212**
16.2	**කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්**			
	කාර්ය මණ්ඩල ණය - දස මස්		6,228,518	6,603,959
	කාර්ය මණ්ඩල ණය - 11.5% (250,000)		4,166,954	5,992,544
	කාර්ය මණ්ඩල ණය - 11.5% (100,000)		2,043,892	175,251
	කාර්ය මණ්ඩල ණය - ටැබ් ණය (4.5%)		688,096	1,622,946
	පාපැදි ණය		30,231	40,320
	උත්සව අත්තිකාරම්		10,500	9,250
			13,168,191	**14,444,270**
17	**මුදල් හා කෙටි කාලීන අරමුදල්**			
	මහජන බැංකුව - 204200 2300 85389 (ඉතුරුම්)		18,373,088	8,387,783
	මහජන බැංකුව - 204100 1600 85389 (ජංගම)		5,740,999	1,931,186
	මහජන බැංකුව - 204100 1800 85388 (ජංගම)		1,525,379	1,215,228
	මහජන බැංකුව - 204100 2500 85389 (ජංගම)		1,436,692	603,947
	අතැති මුදල්		19,383	20,000
			27,095,541	**12,158,144**
18	**විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන**			
	වසර ආරම්භයේ ශේෂය		22,579,760	22,696,045
	වසර සඳහා වූ ප්‍රතිපාදන		3,551,926	(116,285)
	වසර තුල දී ගෙවීම්		(2,087,730)	-
	වසර අවසාන ශේෂය		**24,043,956**	**22,579,760**

			31/12/2023	31/12/2022
			රු.	රු.
19	**අනෙකුත් වගකීම්**			
	ගොඩනැගිලි කුලි තැම්පතු	**19.1**	9,649,434	9,320,571
	උපචිත වියදම්	**19.2**	1,309,889	1,149,339
	රාජ්‍ය සේවකයන් සඳහා ලබාදුන් ණය මූදල් වැඩිපුර අයකර ගැනීම		908,717	3,561,238
	ණය හිමියන්	**19.3**	330,913	296,745
	නැවත ගෙවිය යුතු තැන්පතු		10,000	145,000
	අනෙකුත් තැම්පතු - ආරක්ෂක		100,000	100,000
			12,308,953	**14,572,893**
19.1	**ගොඩනැගිලි කුලි තැම්පත්**			
	ජාතික ඉතිරි කිරීමේ බැංකුව		3,540,000	3,540,000
	ලංකා විදුලිබල මණ්ඩලය		2,700,000	2,700,000
	ලංකා විදුලිබල මණ්ඩලය - (තොරතුරු තාක්ෂණ අංශය)		1,800,025	1,631,571
	සමුපකාර සේවක කොමිෂන් සභාව		1,489,409	1,350,000
	MAA ඇසෝසියේට්ස්		120,000	99,000
			9,649,434	**9,320,571**
19.2	**ගෙවිය යුතු වියදම්**			
	නඩත්තු - ගොඩනැගිලි		347,906	347,907
	විදුලිය		208,345	109,153
	ආරක්ෂක ගාස්තු		197,294	175,240
	විශේෂ දීමනා		174,504	131,367
	වාර්ෂික ප්‍රසාද දීමනා		89,271	27,813
	විගණන ගාස්තු		80,000	70,000
	ගෙවිය යුතු සනීපාරක්ෂක සේවා ගාස්තු		71,050	77,401
	දුරකථන		40,434	44,386
			31,162	-
	ගෙවිය යුතු බදු ගොනු කිරීමේ ගාස්තුව		30,000	25,000
	ජලය		16,664	11,014
	මුද්දර ගාස්තු		16,350	12,225
	අතිකාල		6,112	10,843
	මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය		797	7,200
	ගොඩැනැගිලි රක්ෂණය		-	98,657
	හිඟ වැටුප්		-	1,135
			1,309,889	**1,149,339**
19.3	**ණය හිමියන්**			
	බොල් ණය		330,913	285,838
	ඔප්පු නිදහස් කිරීම්		-	10,907
			330,913	**296,745**
20	**බදුකරණය සඳහා ප්‍රතිපාදන**			
	වසර ආරම්භයේ දී ශේෂය		10,279,402	5,504,476
	වසර සඳහා වූ ප්‍රතිපාදන		26,277,492	15,818,536
			(3,256,527)	-
	බදු ගෙවීම්		(19,433,942)	(11,043,610)
	වසර අවසාන ශේෂය		**13,866,425**	**10,279,402**